# අභිලේඛන (ශිලාලිපි) වලින් හෙළිවන පුරාණ පරිසර සංරක්ෂණය

ජිවන්ති මෙන්ඩිස්

ශ්‍රී ලංකාව ඉතා කුඩා රටක් වුවත් පාරිසරික වැදගත්කම අනුව සලකා බැලීමේ දී ලොව අන් බොහොමයක් රටවල් අභිබවා ඉදිරියෙන් ම සිටී. නිවර්තන කලාපයේ පිහිටීමත්, භූගෝලීය විවිධත්වය වැනි කරුණු නිසා පරිසර පද්ධතීන්, විශේෂ හා ජානමය වශයෙන් ඉහල ජෛව විවිධත්වයක් අප රටේ දක්නට ලැබේ. විවිධ වූ පරිසර පද්ධතීන්හි එයට අනුවර්තනය වූ ශාක හා සත්ව විශේෂ රැසක් දක්නට ලැබේ.

මෙම ජෛව විවිධත්වය පිළිබඳව කරන ලද ඉතාමත් වැදගත් තක්සේරුවක් ලෙස ආසියානු රටවල ජෛව විවිධත්වය පිළිබඳව කරන ලද ඇගයීම සඳහන් කළ හැක. මෙහි දී ඒකක ක්ෂේත්‍රඵලයක දැකිය හැකි ජෛව විවිධත්වය අතින් පොහොසත්ම රට ලෙස ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටී. මේ අනුව ක්ෂීරපායින්, උරගයන්, උභයජීවින් හා සපුෂ්ප ශාක වල විවිධත්වය සැලකීමේ දී ශ්‍රී ලංකාව අනෙකුත් ආසියානු රටවලට වඩා ඉදිරියෙන් සිටී. (වර්ග කි. මී. 10,000 කට අයත් වන සාමාන්‍ය ගණන අනුව රේඛනය කරන ලද තොරතුරු අනුව)

මෙයට අමතරව 2000 වසරේ නෝමන් මේයර් හා පිරිස විසින් කරන ලද ලොව ජෛව විවිධත්වය අතින් උණුසුම්ම ස්ථාන (hot spots) 25 අතරට ඉන්දියාවේ බටහිර ගාට්ස් ඇතුළු ශ්‍රී ලංකාව විශේෂයෙන් ශ්‍රී ලංකාවේ තෙත් කලාපය හඳුනා ගැනීම සඳහන් කළ හැක.

ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සැලකීමේ දී තවත් සුවිශේෂ කරුණක් වන්නේ එහි ඇති ඉහල ඒකදේශියත්වය (endemic species)යි.

වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 14% ක ප්‍රමාණයක් වනජීවි රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ශ්‍රී ලංකාවේ පරිසර විනාශය වැලැක්වීම හා එහි සංරක්ෂණය උදෙසා විවිධ වූ නිති රීති බොහෝමයක් රජයේ අදාල ආයතනයන් මගින් සම්පාදනය කර ඇත.

යටත් විජිත යුගයේ දී විවිධ ආර්ථික බෝග වගාවන් එනම් කෝපි, තේ ප්‍රධාන කොට ගත් අනෙකුත් බෝග වගාවන් සඳහා කඳුකරය ඇතුළු බොහෝ ප්‍රදේශයන් එළි පෙහෙලි කරන ලදී. වර්ෂ 1880 දී ශ්‍රී ලංකාවේ වන වැස්ම මුළු බිම් ප්‍රමාණයෙන් 85% ක් පමණ විය. එය 1992 වන විට මුළු බිම් ප්‍රමාණයෙන් 20%ක් තරම් අඩු වී ඇත.

අතීත හා වර්තමාන තත්වයන් මෙසේ පවතිද්දී ගහකොළ සතා සීපාවා සේම පරිසරය හා එහි සංරක්ෂණය පිළිබඳව ඇති උනන්දුව උද්‍යෝගය දිනෙන් දින වැඩි වන අතරම තවත් පසෙකින් පරිසරය විනාශවීම ද ඒ හා සමානවම සිදු වෙමින් පවතී.



පුවරු ශිලා ලිපියක්

අද අප රට පාරිසරික වැදගත්කම අතින් ලොව අන් රටවල් අභිබවා ඉදිරියෙන් සිටින්නේ අතීතයේ අප මුතුන්මිත්තන් ගහකොළ, සතා සීපාවා ඇතුළු සමස්ථ වටාපිටාව රැකගත් බැවිනි. ඔවුන් පරිසරයේ වැදගත්කම නිසි පරිදි වටහා ගත්තවුන් යැයි කීම වරදක් නොවේ.

එසේ වුව ද වර්තමානයේ දී මෙන්ම පෙර රජ දවස ද මෙවන් වූ පරිසර සංරක්ෂණ නීති රීති රට පාලනය කළ රජ දරුවන් විසින් පනවා ඇති අතරම ඒවා කඩකිරීම හේතු කොටගෙන පනවන්නාවූ දඬුවම් පිළිබඳව ද ලිඛිත තොරතුරු විමසීමේ දී අනාවරණය කරගත හැක. ගස් කැපීම, සතුන් මැරීම වැනි අවස්ථාසේ ම ජලය වැනි සම්පත් ආරක්ෂා කරගැනීම සඳහා ද විවිධ වූ නීති එකල ද ක්‍රියාත්මකව පැවතී ඇත.

මහාවංශය සිංහලේ ඉතිහාසය පිළිබඳව වසර දහස් ගණනක් පුරා අඛන්ඩව ලියැවී ඇති ඓතිහාසික ග්‍රන්ථය වේ. නමුත් එහිද නොලියැවුනු ඇතැම්

බොහෝ ඓතිහාසික තොරතුරු එක් රැස් කරගත හැකි ඉතාම සුදුසු ආකාරය වන්නේ ශිලා ලේඛන හෙවත් අභිලේඛන විශ්ලේෂණයයි.

ක්‍රි. පූ. යුගයේ සිට විවිධ වු කරුණු අරභයා ලියැවී ඇති මෙම ශිලා ලේඛන ආශ්‍රයෙන් එකල පැවති සමාජ, ආර්ථික හා ආගමික ආදී නොයෙකුත් තොරතුරු බොහොමයක් අනාවරණය කරගත හැක.

මේ අතුරින් පරිසර සංරක්ෂණය පිළිබඳව ද ලියැවී ඇති තොරතුරු වැදගත් වේ. පරිසර සංරක්ෂණය උදෙසා එදා සිංහලයා ක්‍රියාකළ ආකාරය පිළිබඳව සොයා බැලීම කාලෝචිත වේ.

වෘක්ෂලතා

අතීතයේ ඉමහත් ශ්‍රී විභූතියෙන් බැබළුනු සශ්‍රීක ස්වයංපෝෂිත කෘෂි සමාජයක් අප රටේ පැවතුනාවූ ද කලාශිල්පයන්ගෙන් විස්මිත නිමැවුම් කළාවූ ද මහාපරිමාණ කර්මාන්තයන් ආදිය කළ ද ඊට සමගාමීව පරිසරය හා සමතුලිතතාවක් ගොඩනගා ගැනීමට ද ඔවුන් සමත්වූ බව කිව හැක. එහි ප්‍රතිඵල ලෙස අද අප මෙවන් වූ ජෛව විවිධත්වයකට හිමිකම් කීමට භාග්‍යය උදාවී ඇත.

අතීතයේ ද රජදරුවන් විසින් වනාන්තර රැකගැනීමට විවිධාකාරයෙන් නීති රීතින් පනවා තිබූ බව අභිලේඛන සාක්ෂි දරයි.

ගහකොළ සතා සීපාවා ආරක්ෂා වීමට බොහෝවිට ම ආගම ද හේතුවන්නට ඇත. බුදුන්වන්සේගේ දේශනයන්වල ප්‍රධාන වශයෙන් ම ඇත්තේ අවිහිංසාවයි. එසේ වුවත් ජීවීන්ගේ ආරක්ෂාව සඳහා නීති රීති පැනවීම ද සිදු වී ඇත.

අතීතයේ භික්ෂූන් සඳහා රජු ප්‍රමුඛ විවිධ වූ ප්‍රභූන් විසින් ද සාමාන්‍ය රටවැසියන් ද ගල්ලෙන් රාශියක් පූජා කර ඇති බැව් දක්නට ලැබේ. වර්තමානයේ ද ආරන්‍යසේනාසන බොහාමයක් ඇති අතර මෙම ආරන්‍යසේනාසන ආශ්‍රිතව වන බිමක් දක්නට ලැබේ. එකල ද මෙවන් භික්ෂූන්වෙත පූජා කරන ලද ගල්ලෙන් ආශ්‍රිතව වන බිම් තිබු බවත් ඒවා ද ආරක්ෂා එක හා සමානව වන්නට ඇති බවත් සිතිය හැක.

කුබිර - තෙරහ වනෙ
කුබිර (කුවේර) තෙරුන්ගේ වනයයි

අම්පාර උහන ඇති සෙල්ලිපියක මෙය දක්නට ලැබේ. මෙම සෙල් ලිපියෙන් කුබිර නම් තෙරනුවක් කෙනෙකු හට එම වනය පූජා කර ඇති බව පැහැදිලි වේ. මෙවන් දැන්වීමක් මගින් එම වනය නිතැතින්ම ආරක්ෂා වන්නට ඇත්තේ සංඝයාට කරන්නාවූ පූජාවන් බුදුන් හට කරන්නක් ලෙස සැලකීම හේතුවෙන් එම වනය මිනිසා ගේ අත පෙවීමෙන් වැලකීමෙනි.

බත - අබයහ ලෙණෙ ශගශ
භර්තෘ අභය ගේ ලෙණ සංඝයාටය

මෙම අභිලේඛනය වවුනියා දිස්ත්‍රික්කයේ මහකච්චට්කෝඩි හි දක්නට ඇත.

ගුතහ ලෙණෙ අගතනගත - චතුදිශ - ශගශ
ගුත්තගේ ලෙණ ආ නොආ සතරදිග සංඝයාටය

සිතුල්පව්ව - කොරවක්ගල ඇති මෙම සෙල් ලිපියෙන් ද බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට පූජා කිරීමෙන් පසුව එම ලෙණත් ඒ අවට ප්‍රදේශයත් ආරක්ෂා වන්නට ඇත. ආගමික භක්තිය හා ආඥාවට ඇති බියත් මීට මුල් වන්නට ඇතැයි සැලකිය හැක.

විහාරාරාමයන්ට අයත්දෑ ප්‍රයෝජනයට ගන්නවුන් බලු කපුටු වන බව සඳහන් අභිලේඛන ද ඇත. මේ නිසාම රට වැසියන් විහාරාරාම හා ඒවාට අයත් ගම්බිම් සතු දෑ වෙත ඇල්මක් නොදක්වන්නට ඇත.

මොරගොඩ ටැම් ලිපිය මීට හොඳම උදාහරණයක්



ටැම් ලිපියක්





ලෙස දැක්විය හැක. ක්‍රි. ව. 10 වන ශතවර්ෂයේ 4 වන කාශ්‍යප රජුගේ සමයෙහි කරවන්නට ඇතැයි සැලකෙන අතර මෙම අභිලේඛනයෙහි ඇමතිවරුන් දෙදෙනෙකු විසින් රජුගේ අණ පරිදි පිරිවෙනකට පුදන ලද වැවක ජලයෙන් වවන ඉඩම් පිළිබඳ වරප්‍රසාද සඳහන් වේ. මේ නීතිය කඩ කරන්නන් බලු කපුටුව උපදින බව සඳහන් කර ඇති අතර එහි ඉර හඳ, බලු කපුටු රූප ද කොටා ඇත.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ වන වැස්ම වැඩිම දිස්ත්‍රික්කය වන්නේ අම්පාර දිස්ත්‍රික්කයයි. මෙ දිස්ත්‍රික්කයේ 37.5%ක් වනයෙන් වැසී පවතී.

සිරකරුවෙක් ලෙස වසර ගණනාවක් මෙරට සිට නිදහස ලබා පලාගොස් එදා හෙළදිව නම් වටිනා ග්‍රන්ථය රචනා කළ රොබට් නොක්ස් පවසන පරිදි මෙම වනාන්තර ප්‍රදේශ තමන්ගේ ආරක්ෂාව පිණිස ද පවත්වා ගෙන ගොස් ඇති බව කියැවේ. මේ නිසා කන්ද උඩරට ප්‍රදේශයේ කැලෑ ද කපා දැමීම රාජ නීතයෙන් තහනම් කර ඇති බව ද ඔහු විසින් සඳහන් කරයි. තවද වනාන්තරය රැකගැනීම සඳහා මහරජු විසින් වන රක්ෂණ නිලධාරීහු පත්කර තිබූ බව සඳහන් කරයි. මේ අනුව වනාන්තර ආරක්ෂාව සඳහා ද වැදගත් ලෙස සලකා ඇති බැව් පැහැදිලිවේ.

අතීතයේ රජු ප්‍රමුඛ ප්‍රභූන් හා ආගමික ස්ථානවලට හැර පොදුවේ සාමාන්‍ය ජනයාගේ ප්‍රයෝජනය සඳහා දැවමය භාවිතය ඉතා අඩු මට්ටමක තිබෙන්නට ඇතැයි සිතිය හැක. රොබට් නොක්ස්ගේ වාර්තාවට අනුව සාමාන්‍ය ජනතාවගේ වාසස්ථාන වරිච්චි බැඳ මැටි ගැසූ බිත්ති වලින් හා අතු සෙවිලි කල වහල වලින් යුක්ත වූ බව සඳහන් කරයි. තවද වඩුවන් හෝ හුණු වඩුවන් ලවා වැඩ ගැනීමට සාමාන්‍ය වැසියන්ට අවසර නොවූ බවත් ගම් වැසියන් තම තමන්ගේ නිවාස තම තමන්ම සාදාගත් බවත් සඳහන් කරයි. සීමාව ඉක්මවා විශාල වූ හෝ නිවාස තැනීමට රජු ඉඩ නොදෙන බවත් ඔහු සඳහන් කරයි. එසේ ම වාසස්ථාන වල ගෘහභාණ්ඩ ඉතා අල්ප බව සඳහන් කරයි. එබැවින් ගෘහභාණ්ඩ තැනීමට අවශ්‍ය දැව කැපීම අවම වීමත් සිදුවන්නට ඇත. තවද වඩුවන් ලවා වැඩ ගැනීමට සමාන්‍ය ජනතාවට අවසර නොතිබීමත් තවත් හේතුවක් වන්නට ඇත.

අභයගිරි පුවරු ලිපියේ ද ගස් කොළන් නොකැපිය යුතු බවට සඳහන්ව ඇත. 5 වැනි කාශ්‍යප රජු විසින් කරවන ලද අභයගිරි පුවරු ලිපියේ (ක්‍රි. ව. 929- 939) පේළිය 15 -19 අභයගිරි වෙහෙරට හා චේතියගිරි විහාරයට අයිතිනාක් ඇතුළු විහාරයෙහි වූ ගම්බිම් වලට ද ආබද්ධ වූ විහාරවලටත් රජමහා විහාරයට ද පිරිවෙනට ද භාවනා ගෘහ වලට ද මෙහෙනි ආරාමවලට සංඝයා සන්තක පුද්ගල සන්තක ලාභ ලබන තැන්වලත් ඒවා හා සම්බන්ධ සියලු ගම්බිම්වලට අයත් ගස්කොලන් නොකැපිය යුතු බවට නීතියක් පනවා ඇත.

3 වැනි උදය රජු විසින් (ක්‍රි. ව. 964 -972) කරවූ බදුලු ටැම් ලිපියේ ද "දෙමුළු බද් වල් වැල දඬුපත් නොකපනු කොට ඉසා මෙහෙකරුවනට ආකුල නොකරනු ඉසා..........." යනුවෙන් නිකාය දෙකට (දෙමුළට) අයත් කැලෑ වල දර නොකැපිය යුතු යයි ද ඒවායේ වැඩ කරන සේවකයන්ට හිරිහැර අවුල් වියවුල් නො කිරීමට ආඥා පනවා ඇත.


වනාන්තර හා ගහකොළ රැකගැනීම පිළිබඳව අතීත තොරතුරු සොයා යාමේ දී මිහින්තලා පුවරු ලිපිය ද අමතක නොකළ හැක. මෙහි පළමු ලිපියේ වතු සහ කුඩා වතු කැබලිවලට වැදී නීති විරෝධී දෙය නොකට යුතුය. ගස් කොලන් නොකැපිය යුතු බවත් විහාරය හා ඊට අයත් ගම්බිම්වල තල් ගස් හා මී ගස් ආදී ඵල හටගන්නා ගස් විහාර ගම්බිම්වල කටයුතු සොයා බැලීම්වල නිරත නායකකයින් සමගියෙන් දුන්නොත් හැර කපන්නට ඉඩ නොදිය යුතු බව සඳහන් කර ඇත.


ක්‍රි. ව. 10 වන ශතකයට අයත් අබාසලමෙවන් රජුගෙන් 12 වැන්නෙහි යැයි සැලකෙන උදාමහයා තුමාගේ පුලියම්කුලම් පුවරු ලිපියේ ද තල්ගස් හා මී ගස් නොකැපිය යුතු බව සඳහන් තවත් අවස්ථාවකි.

මී ගසෙන් ලබා ගන්නා කොළ, පොතු ආදී සියලු දෙයක්ම ආයුර්වේද ඖෂධ වශයෙන් ප්‍රයෝජනයට ගනු ලැබේ.

මී ගස් කැපීම පැරණි රජවරුන් රාජද්‍රෝහී ක්‍රියාවක් ලෙස සලකන ලදී. මී ගස් කුඹුරු අසල තිබීමෙන් කුඹුරු සරුසාර වන බවට මතයක් ද ඇත. මෙසේ සරුසාර වන්නේ මී ගස් වලට පැමිණෙන වවුලන්ගේ වසුරු කුඹුරට එක් වීමෙනි.







ගල්පොත ශිලා ලිපිය - පොළොන්නරුව

පෙර කළ රජුන් විසින් කඳුකරය **දෙවියන්ගේ** **අඩවිය** ලෙස නම් කිරීමෙන් කඳුකරයේ හරිත වියන ආරක්ෂා වූයේ දෙවියන්ගේ අඩවියට ඇතුල්වීමට කිසිවෙකුත් උත්සාහ නොගත් බැවිනි.

නමුත් මෙම දෙවියන්ගේ අඩවියට යටත් විජිත යුගයේ සිදුවූයේ අපූරු දෙයකි. එය එම යුගයේ විසූ විදේශිකයෙකුගේ වාර්තාවකින් ම සඳහන් කරන්නේ නම්,

වර්ෂ 1945 - 1850 දක්වා කාලය තුළ ලංකාවේ මහ ලේකම් ලෙස කටයුතු කළ ශ්‍රීමත් එමර්සන් ටෙනන්ට් පාලකයෙකුට අමතරව ශාස්ත්‍රීය කටයුතු කෙරේ ද, ප්‍රසිද්ධියක් උසුලන්නෙකි. ඔහු විසින් රචිත (Ceylon) ග්‍රන්ථයේ බ්‍රිතාන්‍යයන් විසින් කෝපි වගාව සඳහා කඳුකරය එළිකිරීම පිළිබඳව සඳහන් කර ඇත. එහිදී තුරු ලතාවන් පිළිබඳව විසිතුරු විස්තරයක් කරන ටෙනන්ට් එවන් සුන්දර වූත් වටිනා කඳුකරයේ හරිත වැස්ම කෝපි වගාව සඳහා එළි කල අයුරු ද සඳහන් කරයි. මෙහි දී වානාන්තර එළි කිරීමේ දී යුරෝපීය වගාකරුවන් විසින් සේවය සඳහා ලාංකීය ගස් කපන්නන් මෙන්ම මලබාවේ කුලී කරුවන් ද යොදාගත් බව සඳහන් කරයි. වැල් වලින් ගස් එකිනෙක එතී ගිය අධික බෑවුම් සහිත කඳුකර පෙදෙස්වල ගස් කැපීමේ දී පළමුවෙන් ම අක්කර කිහිපයක ඇති ගස් කඳන් වල බාගයක් පමණ හරහට කපා දමා පසුව ඉහලින් ම පිහිටි උස ගස් වල කඳන් සම්පූර්ණයෙන් ම කපනු ලබන අතර මේ ගස් ඇද හැලෙන විට, අඩ වශයෙන් කඳන් කපන ලද පහල පිහිටි ගස් මතට ඇද හැලීමට සලස්වනු ලැබේ. ඉතාමත් හද කම්පා කරවනු ලබන මෙම අවස්ථාවේ දී වැල් මගින් එකට එතී සම්බන්ධවී තිබූ විශාල ගස්, මෙම ඇදහැලීමේ දී ද එක පෙලට මහා හඬක් නගමින් ඇද හැලෙන බැව් සඳහන් කර ඇත.

එම ක්‍රියාවලියේ දී වනාන්තරයේ දී ගස් ඇද වැටෙන විලාපය හැතැම්ම ගනන් ඈතට ඇසෙන බැව් සඳහන් කරයි.

සතුන්

සතුන්ගේ ආරක්ෂාව සඳහා අතීත රජදරුවන් කටයුතු කළ ආකාරය පිළිබඳව අභිලේඛන තොරතුරු සොයා බැලීමේ දී ක්‍රි. ව. 12 වන ශතකයේ (1187 - 1196) නිශ්ශංකමල්ල රජුගේ අනුරාධපුර සෙල්ලිපිය සඳහන් කළ හැක.

සතුන්ට අභයදීමක් පිළිබඳව එම සෙල්ලිපියේ සඳහන් වේ. මෙහි දී නුවරට හත්ගව්වක් දුර පටන් සතුන් නොමැරිය යුතු බවත් අභය දිය යුතු බවත්, මසුන්ටත හා පක්ෂීන්ට ද අභය දිය යුතු බවත් සඳහන් කරයි.


එළුවන් මැරීම තහනම් කර ඇති සෙල්ලිපි කිහිපයක් ම හමුවේ. ක්‍රි. ව. 10 වන ශතකයේ අවසන් කොටසට අයත් කතෘ අඥාත අනුරාධපුර ගල් ඔරුවේ සන්නසේ එළුවන් මරන්නා අකුසල් ලබන බව සඳහන් කර අත. එළුවන් මැරීම බරපතල වරදකැයි සම්මතව තිබූ බව පැහැදිලි වේ.

4 වන මිහිඳු රජු (ක්‍රි. ව. 956 - 972) රජවීමෙන් 9 වන වස කරවන ලදැයි සැලකෙන වේවැල්කැටියේ සෙල්ලිපියේ එළුවන්, මීවුන්, හෙරි ගොන් මැරීමට දඬුවම වූයේ මරණීය දණ්ඩනය බව සඳහන් කර ඇත. තවද දඬුවම් වශයෙන් අත් පා කප්පවන ලෙස ද නියම කර ඇත.

මෙයට අමතරව කිහිල්ලේ හන ගසා රටින් පිටුවහල් කිරිම වැනි දඬුවම් ද පැමිණ වූ බැව් ශිලා ලේඛන වල සඳහන් වේ.

දඹුලු ගිරි ලිපියේ මාසාතය හෙවත් අසුවල් දවස් හා අසුවල් පෙදෙස් හි සතුන් මැරීම තහනම් යැයි නීති පනවා ඇත.

මේ අනුව බලන කල අද මෙන්ම එදා ද පෙර රජ දරුවන් එක් පසෙකින් කෘෂිකර්මාන්තය නගා සිටුවමින් මෙන් කලා ශිල්ප කර්මාන්ත ගෘහනිර්මාණ ශිල්පය වැනි බොහෝ පැති වලින් ඉතාමත් ඉහල දියුණුවක් ලබමින් සමෘද්ධිමත් භාවයට රට පත් කරන ලද අතර ම එම සංවර්ධනය, දියුණුව පරිසරය හා සමබරව



ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මීය අක්ෂරවල දියුණුව

තිරසාරව තබාගැනීමට ද උත්සාහගෙන ඇති බව පැහැදිලි වේ. ඒ සඳහා ආගමික වශයෙන් ලත් සංවරය හා සංයමය මෙන් ම නීති රීති ද යොදාගත් බව පැහැදිලි වන අතර මෙම නීති රීති වලට පටහැනිව කටයුතු කිරීමට පෙළඹෙන පුද්ගලයන් මානසික වශයෙන් ද පසුබෑමකට ලක්කිරීම් සඳහා උපක්‍රම යොදා ඇති බව පැහැදිලි වේ. ඒ සඳහා නීති රීති කඩ කරන්නන් බලු කපුටන් වන බව සඳහන් කිරීම උදාහාරණයක් ලෙස දැක්විය හැක.

සතුන් මරන්නාට මරණීය දණ්ඩනය වැනි ඉතා දරුණු දඬුවම් පැමිණවීමෙන් සෙසු අය ද, එම වරද නැවත කිරීමෙන් වලක්වන ලදී. එසේ ම අත් පා කැපීම, කිහිල්ලේ හන ගැසීම හා රටින් පිටුවහල් කිරීම වැනි දඬුවම් සෙසු අයගේ අවධානය හා බියට පත්කිරීම සඳහා යොදා ගන්නට ඇත.

කුමන ලෙසකින් හෝ ඔවුන්ගේ අරමුණ වී ඇත්තේ පරිසරයේ ගහකොළ සතා සීපාවා රැකගැනීමට කටයුතු කිරීම බැව් මෙම අභිලේඛන කිහිපය පිළිබඳව විමසීමෙන් පමණක් වුව ද සලකා බැලීමෙන් අවබෝධ කරගත හැක.

## ග්‍රන්ථ නාමාවලිය


රොබට් නොක්ස් - එදා හෙළදිව

එමර්සන් ටෙනන්ට් - ඇසදුටු ලංකාව - වෘක්ෂ ලතා

නන්දසේන මුදියන්සේ - සිංහල ශිලා ලේඛන සංග්‍රහය

කොත්මලේ අමරවංශ - ලක්දිව සෙල්ලිපි (1969)

වජිර ධර්මවර්ධන - ගස් ගෙම්බෝ සිංහල සහල් සහ ජාන හොරු - ජෛව විවිධත්වය පිළිබඳ තෙවන ලොව දැකීමක්

සොබා - පරිසර ප්‍රකාශනය ජනවාරි - අප්‍රේල් 1998 කලාපය 1 වෙළුම 7



**ජීවන්ති මෙන්ඩිස්**
පර්යේෂණ සහකාර (ප්‍රවර්ධන අංශය)
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය